**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2018**
**---------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හම්බන්තොට සූර්ය බලාගාරය සඳහා ඉන්වර්ටර් (Inverters) මිලදී ගැනීම හා ප්‍රතිස්ථාපනය කිරීමට සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු. 22,145,944 ක මුදල ප්‍රාග්ධනිත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයට ලියා හැර තිබුණි. | විගණකාධිපතිතුමාගේ උපදෙස් පරිදි ඉන්වර්ටර් (Inverter) ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනිත කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලදී ඉදිරිපත් කිරීමට කටයුතු යොදා තිබේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට හා අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල් ව්‍යාපෘති 02 ක් වූ National Appropriate Mitigation Actions (NAMA) සහ ජෛව ස්කන්ධ (Biomass) ව්‍යාපෘති වලට අදාල 2016 වර්ෂයේ ආදායමට එරෙහිව ගැලපිය යුතු පිළිවෙලින් රු.1,036,803 ක් සහ රු.1,970,834 ක මුදල් තවදුරටත් ගෙවිය යුතු වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් ජංගම වගකීම් රු.3,007,637 කින් වැඩියෙන් දක්වා තිබුණි. | NAMA හා Biomass ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ගිණුම් ලෙස තබා ඇති සටහන් 2019 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | අදාල ගැලපුම් කර ජංගම වගකීම් නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ යුතුය. |
| (ඇ) 2016 හා 2017 වර්ෂවලට අදාළ රු. 1,290,079 ක වියදම් 2018 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | මෙ පිළිබඳ වවුචර් පත් නිරීක්ෂණය කොට 2019 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට බලාපොරොත්තු වෙමු. | වර්ෂයට අදාල වියදම් එම වර්ෂය තුලදීම ආදායමට එරෙහිව කපාහැරිය යුතු අතරම වර්ෂයේ ගිණුම් පියවීම සඳහා වර්ෂය අවසානය වන විට සියලුම අංශ මඟින් වවුචර්පත් ලබාගැනීමේ ක්‍රමවේදය විධිමත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ක්‍රමෝපාය අංශයේ ST 04 වැඩසටහන යටතේ දරන ලද රු. 1,296,000 ක වියදම වැරදීමකින් වෙනත් අත්තිකාරම් ගිණුමට හර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ක්‍රමෝපාය අංශයේ ST 04 වැඩසටහන යටතේ දරන ලද රු. 1,296,000/= වියදමට වැරදීමකින් අත්තිකාරම් වෙනත් ගිණුමකට හර කොට ඇති අතර, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් එය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | ලෙජරයට සටහන් කරනු ලබන සෑම ගණුදෙනුවකම නිරවද්‍යතාව වෙනත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කළ යුතුවීම. |
| (ඉ) | වියදම රු. 4,360,584 ක් වූ ක්‍රමක්ෂය හා රජයේ ප්‍රදාන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදිව ගලපා නොතිබුණු අතර කාරක ප්‍රාග්ධන විචලනය ගණනය කිරීමේ දී රු. 980,915 ක් අඩුවෙන්ද ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 68,266 කින් වැඩියෙන්ද දක්වා තිබුණි. එම නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ප්‍රකාරව නිවැරදිව සකස් කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කළ යුතුය. |
| (ඊ) | වැඩ අවසන් වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල් ව්‍යාපෘතියකින් මාරු කළ රු. 457,490 ක් වූ වත්කම්, ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා තිබුණ ද එම අගය මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය විගණනයට ඉදිරිපත් කර ඇත. | ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් කරන ගණුදෙනු ලෙජරයේද සටහන් කරන බවට තහවුරු කර ගත යුතුය. |
| (උ) | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අධිකාරිය විසින් සංවර්ධනකරුවන්ගෙන් ලබාගෙන ඇති ගෙවිය යුතු තැන්පතු මුදල් (ජංගම වගකීමක්) රු. 5,049,485 ක් මූල්‍ය ප්‍රකාශන තුළ දීර්ඝකාලීනව සටහන් වුව ද එය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | ඉඩම් අත්පත් කර ගැනීම සඳහා සංවර්ධනකරුවන්ගෙන් ලබාගෙන ඇති මුදල් පිළිබඳ ලේඛනය සකස් කර යාවත්කාලීන කරමින් පවතී. | සංවර්ධනකරුවන්ගෙන් ලබාගන්නා තැන්පතු මුදල් සටහන් කරමින් විධිමත් ලේඛණයක් පවත්වාගෙන යායුතුය. |
| (ඌ) | ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියකට අදාළව උපකරණ මත බදු රු. 2,299,935 ක් කෙරීගෙන යන වැඩ යටතේ වර්ෂ කිහිපයක සිට ඇතුලත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී ද මේ පිළිබඳ සොයාබලා ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ADB ව්‍යාපෘතියට අදාල උපකරණ මත බදු 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | මූල්‍ය ප්‍රකාශනයේ අධිකාරියේ ගණුදෙනු පමණක් සටහන් කල යුතුය. (ව්‍යාපෘති සඳහා වෙනම ගිණුම් පිළියෙල කරන බැවින්) |

| | | |
|---|---|---|
| (එ) පසුගිය වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යා නැවත ප්‍රකාශ කළ (Restated) බව මූල්‍ය ප්‍රකාශයේ සඳහන් වූවත් එසේ කටයුතු කර නොතිබුණු අතර අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර තිබුණ ද ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රති ප්‍රකාශිත මූල්‍ය සටහන් විගණනයට ඉදිරිපත් කර ඇත. | ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේ දී පළාත් 09 වෙනුවෙන් අධ්‍යාපන කලාප වැඩ සටහන් සඳහා දැනුම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.13,348,087 ක් අත්තිකාරම් ලෙස කලාප කාර්යාල වෙත ලබා දී තිබූ අතර එයින් රු.3,765,051ක අත්තිකාරම් මුදල් 2018 දෙසැම්බර් 31 දින දක්වාම නිරවුල්කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අදාල අධ්‍යාපන කලාප වලට ලිපි යොමු කර ඇති අතර, ඉක්මනින්ම මෙම මුදල් පියවීමට කටයුතු සූදානම් කර ඇත. | අත්තිකාරම් ලබාදුන් කාර්යය නිම කල වහාම අදාල අංශය විසින් එය අධීක්ෂණය කර මුදල් පියවා නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) ලැබිය යුතු අත්තිකාරම් යටතේ ඇතුලත් රු.1,093,512 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාලයක් ඉදිරියට ගෙන එමින් පවතින අතර එම මුදල් අය කර ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. | ලැබිය යුතු අත්තිකාරම් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | ලබාදුන් අත්තිකාරම් පිළිබඳ සමාලෝචනය කරමින් අදාල කාර්යය නිම වූ වහාම නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ගෙවීම් හා ණයහිමියන් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 15,735,724 ක් අතරින් රු. 6,952,796 ක් වර්ෂ 05ට වැඩි කාලයක සිටද රු. 7,247,388 ක් වර්ෂ 01 සිට 04 ක කාලයක සිටද උපචිත වියදම් තුල ඇතුලත් රු. 73,044 ක ශේෂය වර්ෂ 8ක පමණ කාලයක සිට ද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මෙම මුදල නිරවුල් කිරීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. | වෙනත් ගෙවීම් ගිණුම්, ණය හිමි ගිණුම්, උපචිත වියදම් ගිණුම් පියවීමට හා නිවැරදි කිරීමට අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත. | ණයහිමියන් හා වෙනත් ගෙවිය යුතු ශේෂ සමාලෝචනය කරමින් ගිණුම් කාලයන් තුල පියවීමට කටයුතු කිරීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතේ 46 (3) වගන්තිය | සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් වසර 30කට බදු ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරීම සඳහා 2015 සිට 2018 වර්ෂය දක්වා එකතුව රු.65,794,255 ක් අධිකාරිය විසින් අරමුදලේ අරමුණු වලට පටහැනි ලෙස බලශක්ති අරමුදලේ ආයෝජන වලින් ඉවත් කරගෙන තිබුණි. ජනතාවට බලශක්ති අරපිරිමැස්ම පිළිබඳ දැනුවත් කිරීමට සහ අවම ස්වභාවික සම්පත් භාවිතයෙන් විදුලිය අරපිරිමැස්මෙන් ගොඩනැගිලි නිර්මාණය කළ හැකි බවට පෙන්වන ප්‍රදර්ශන ගොඩනැගිල්ලක් ලෙස මෙම ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකරන බවත් ජනතාව දැනුවත් කිරීම සඳහා අරමුදලින් වියදම් කළ හැකි බවත් අධිකාරියේ සභාපතිවරයා දන්වා තිබුණි. | අධිකාරියේ ප්‍රධාන ගොඩනැගිල්ල " Energy Plus" යන තේමාව යටතේ සැලසුම් කර ඇත. ජනතාවට බලශක්ති අරපිරිමැස්ම සහ අවම ස්වාභාවික සම්පත් භාවිතයෙන් විදුලිය අරපිරිමැස්මෙන් ගොඩනැගිලි නිර්මාණය කළ හැකි බවට පෙන්වන ප්‍රදර්ශක ගොඩනැගිල්ලකි. ජනතාවට ප්‍රායෝගිකව බලශක්ති සංරක්ෂණ ක්‍රම යොදා ගත හැකි ක්‍රමවේද සියසින් දැක ගත හැකි නිර්මාණයක් බැවින් "එය විගණන අංශය අරමුදලට පටහැනිව සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාලයක් නිර්මාණය කිරීම " යනුවෙන් විගණනයේදී අර්ථ දැක්වීම ඉතාම කණගාටුවට කරුණකි.<br>අධිකාරි පනතේ ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රතිපාදන තිබෙන බැවින් අරමුදලේ ප්‍රතිපාදන වියදම් කළ හැක. "මෙම වියදම් සියල්ල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව සිදු කර ඇති බවද දන්වමි." | අධිකාරියේ පනත හා බලශක්ති අරමුදලේ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II වන පරිච්ඡේදයේ 13.7 ඡේදය | වැඩ බැලීමේ තනතුරක් සඳහා නිලධාරියෙකු පත් කිරීමේ බලධාරියා විසින් පත් කර ඇත්තේ නම් මිස ඔහුට අතිරේක පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතු වුවත් අධිකාරිය විසින් එයින් බැහැරව වැඩබලන තනතුරු සඳහා 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය මැයි දක්වා වැඩ බැලීමේ | අධිකාරිය 2007 වසරේ ස්ථාපනය කොට ක්‍රියාත්මක වූයේ එහි පූර්වප්‍රාප්තික ආයතනය වූ බලශක්ති සංරක්ෂණ අරමුදලේ නිලධාරීන්ගේ සේවය ලබමිනි. අධිකාරියේ පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරි වසර 3 සඳහා | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව |

| | | | | |
|---|---|---|---|---|
| | | දීමනා ලෙස එකතුව රු.3,714,952 ක් ද, ඉන්ධන දීමනා ලෙස රු. 4,853,050 ක් ද, ප්‍රවාහන දීමනා වශයෙන් 2015 සිට 2019 වර්ෂයේ මැයි දක්වා රු. 5,020,000 ක් ද ගෙවා තිබුණි. | අධිකාරියේ කටයුතු පිළිබඳ සංයුක්ත සැලැස්මක් ඉදිරිපත්කොට අනුමැතිය ලබාගන්නා වුවද අධිකාරියේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය මානව සම්පත් අධිකාරිය වෙත ආකර්ෂණය කරගැනීමට සරිලන බඳවා ගැනීම් ක්‍රියාපටිපාටියට අදාල අංශවලින් අනුමත කරගැනීමට නොහැකිව ඇත. බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය මෙ වන විට සාදා නාම කොට ඇත. මෙම වැඩබැලීමේ තනතුරු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව මේ වනවිට නතර කර ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 454 | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. | විගණකාධිපතිතුමාගේ උපදෙස් ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා ගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 757(1) | වත්කම් භෞතික සත්‍යාපනය කර නොතිබුණි. | විගණකාධිපති තුමාගේ උපදෙස් මත අදාල ආකෘති පත්‍ර මත පදනම්ව 2019 භෞතික වත්කම් සත්‍යාපනය කිරීමට කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වත්කම් භෞතික සත්‍යාපනය කල යුතුය. |
| **(ඉ)** | භාණ්ඩාගාර චක්‍රලේඛ 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු. 978,732,975ක් වූ ස්ථාවර වත්කම් සඳහා ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන ඇති අතර, එය 2020 වර්ෂයේ මැයි මස වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යායුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන චක්‍රලේඛය 9.3 ඡේදය | අධිකාරිය සියලු සේවකයන් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය සකස් කොට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර පහළ ශ්‍රේණියේ සිට කළමනාකරණ සහකාර තනතුර දක්වා පමණක් මේ වන විට අනුමැතිය ලැබී ඇත. | අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කරගත යුතුය. |
| (උ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නොගැනෙන අධිකාරියේ ඉංජිනේරු තනතුර දරන නිලධාරීන් සඳහා 2016 අගෝස්තු මස සිට 2018 දෙසැම්බර් 31 දක්වා රු.10,751,000 ක මුදලක් (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් පමණක් හිමිකම් ලබන) වෘත්තීය දීමනා ලෙස අධිකාරිය විසින් ගෙවා තිබුණි. | මේ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග දැනටමත් අමාත්‍යාංශය හරහා සිදුකරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| “ස්විච් -ඒෂියා” වැඩ සටහන යටතේ ලැබී ඉතිරිව තිබූ රු. 4,548,176 ක් 2011 වර්ෂයේ සිට මහජන බැංකුවේ ජංගම ගිණුමකද, බලශක්ති අරමුදලට අදාල රු.150,000,000 කට වැඩි මුදලක් වසර ගණනාවක සිට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක ද කිසිදු ඵලදායී ආයෝජනයක යොදවා ගැනීමෙන් තොරව තැන්පත් කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව මෙම මුදල ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. | අදාල අනුමැතීන් යටතේ ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 91,854,384 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 49,834,339 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 42,020,045 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචන

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට 2012 නොවැම්බර් මස RCL (Regional Centre for Lighting) මධ්‍යස්ථානයේ කළමනාකරණය සහ වත්කම් පවරා දී තිබුණ ද මෙම පවරාදීම නිසි පරිදි සිදුනොවීම හේතුවෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පදනමට අධිකාරිය විසින් ගෙවන ලද රු.8,033,270 ක් වු හිඟ බදු කුලී 2019 දෙසැම්බර් දක්වාම ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | RCL (Regional Center for Lighting) මධ්‍යස්ථානයේ කුලිය අධිකාරියේ වියදමක් ලෙස හඳුනාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදහස් විමසා සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ. |
| (ආ) "ස්විච්-ඒෂියා" වැඩසටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු.7,334,354 ක මුදලින් රු.3,135,202 ක්, 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හි දී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 දෙසැම්බර් 03 දින දෙන ලද නියෝගය 2019 දෙසැම්බර් දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් මත අදාළ මුදල් අය කරගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වු දෝෂ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේ වාර්ථාව අනුව 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා රු. 2,171,760 ක් අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට හෝ නිවැරදි කිරීමට මේ දක්වා අධිකාරිය කටයුතු කර නොතිබුණි. | ආයතනයේ නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව සේවකයන් අන්තරග්‍රහණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව කමිටුවක් පත්කරන ලද අතර එම කමිටුවේ එක් ප්‍රධාන කාර්යයක් ලෙස මේ පිළිබඳව අධ්‍යයනය කිරීම ද ඇතුළත් කර ඇත. එම කමිටු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. | අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන ලද කමිටුවේ වාරතාව කඩිනමින් ලබාගැනීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම. |
| (ඈ) 2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු7,.956,800 ක් ගෙවා තිබුණි . කෙසේ වුවද, 2019 දෙසැම්බර් 30 දින දක්වා වර්ෂ 12ක් ගත වී තිබුණද , මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කරනු ලැබූ වියදම සඵලදායි කරගැනීම සඳහා නීති උපදෙස් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදුව සමථයකට පත්කරගැනීම පිළිබඳ අපක්ෂපාති බේරුම් කරුවෙකුගේ සහය ලබා ගන්න ලදී. ගිවිසුම් ප්‍රකාර ව්‍යාපෘතිය අවසන් කිරීමට අපහසු බවත්, ඒ වෙනුවෙන් මාදිලි ත්‍රිත්වයම ප්‍රදර්ශනය කල හැකි රථයක් නිර්මාණය කර දීමට අදාළ පාර්ශවය යෝජනා කොට ඇත. එම යෝජනාව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කොට අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | නීත්‍යානුකූලව ගිවිසුම් මත කටයුතු කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති රු. 10,333,800 ක් වටිනා ක්‍රියාකාරකම් 2 ක් වර්ෂ කිහිපයක සිට ක්‍රියාත්මක නොවන බව හා ඒ සඳහා 2018 වර්ෂයේ දී ද කිසිදු වියදමක් දරා නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. මෙම වැඩ සටහන් සම්පූර්ණ කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | බගවන්තලාව සුළං මාපක කුලුනෙහි වැඩ කටයුතු 2019 වර්ෂය තුළ නිම කළ අතර, එය 2019 මූල්‍ය ප්‍රකාශන වලදී ඉදිරිපත් වන අතර, එහි වටිනාකම රු. 2,377,000/= කි. විද්‍යුත් මෝටර් රථ නිපදවීම සඳහා වැය කළ මුදල රු. 7,596,800/= ක් වන අතර, මේ වන විට එය බේරුම්කරණය සඳහා යොමු කර ඇත. | වැඩ සටහන් නිරන්තර අධීක්ෂණයට ලක් කල යුතු අතර ඒවා සම්පූර්ණ කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ මෙම ව්‍යාපෘති 04 ට අදාලව අයවැයගත වියදම රු. 526,135,593 ක් හා තත්‍ය වියදම රු. 350,391,197 ක් වූයෙන් මුළු ප්‍රතිපාදනයෙන් රු. 175,744,396 ක් එනම් සියයට 33 ක් ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය. | බොහෝ විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තත්‍ය කාලය තුල වියදම් සිදුකළ යුතුවුද මෙම වියදම් වාර්තා කිරීමට ඇති පමාව නිසා මෙම තත්ත්වය හටගෙන ඇත.<br>තත්‍ය කාලය තුල දීම මෙම වියදම් වාර්තා කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | අයවැය කාලීනව සමාලෝචනය සිදුකල යුතු අතර වියදම් කාලපමාවකින් තොරව මූල්‍ය අංශය වෙත ලබාගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සකස්කිරීම. |
| (ආ)ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණ වැඩසටහන යටතේ (ODSM) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ප්‍රධාන අංශ 6ක් යටතේ සමාලෝචිත වර්ෂයේ දී රු. 17,000,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද ඉන් රු. 8,876,452 ක් පමණක් වැය කර තිබුණු අතර රු. 8,123,548 ක් එනම් සියයට 48 ක් ඉතිරිව තිබුණි. දරන ලද මුළු වියදමෙන් කාර්යාලීය ගොඩනැගිලි කුලී ඇතුළු පරිපාලන වියදම් රු. 5,957,701 ක් වු අතර ව්‍යාපෘතිය සඳහා වියදම් කර තිබුණේ රු. 2,918,751 ක් පමණි. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමට රේඛීය අමාත්‍යාංශය එළඹී ඇත්තේ වසර 2017 දීය. එහි ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික මෙහෙයුම් කමිටුව සතු වන අතර අධිකාරිය විසින් සම්පාදනය කරනු ලබන්නේ එහි ලේකම් කාර්යාලයට සම්බන්ධිත පරිපාලන කටයුතු සඳහා දායකත්වය සැපයීම පමණි. මෙම වැඩසටහන සඳහා කළමනාකරණ ඒකකය ස්ථාපනය කිරීමට අවශ්‍ය තනතුරු සංඛ්‍යාව අනුමත කර ගැනීමට අප විසින් විවිධ අවස්ථාවලදී විවිධ හේතු දක්වමින් රේඛීය අමාත්‍යාංශයද කළමනාකරණ දෙපාර්තමේන්තුවද මෙම තනතුරු අනුමත කිරීම් මේ දක්වා සිදුකර නොමැත. මෙවැනි තත්ත්වයක් යටතේ මෙම නිසා වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ මෙම අධිකාරියේ සේවය කරන නිලධාරීන් පිරිසකගේ දායකත්වයෙනි.<br>මේ නිසා වෙන්කළ ප්‍රතිපාදන සම්පූර්ණ වශයෙන් යොදා ගැනීමට නොහැකි වූයේ අත්‍යවශ්‍ය මානව සම්පත් වැඩසටහනට යොදවා ගැනීමට එල්ල වී ඇති බාධාව නිසාවෙනි. | කාර්යසාධනය වැඩි කරගැනීම සඳහා ප්‍රමාණවත් මානව සම්පත් යෙදවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ සුදුසු කඩිනම් පියවර ගත යුතු වේ. |
| (ඇ) ඉඳුරාන ජාත්‍යන්තර ප්‍රවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය සඳහා රු. 25,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ඉන් සියයට 26 ක් පමණක් එනම් රු. 6,392, 059ක් 2018දෙසැම්බර් 31 දිනට වැයකර ඇති අතර සියයට 74 ක් එනම් රු. 18,607,941 ක් | ඉඳුරානට රු. මි. 5 ක් වෙන් කර තිබුනද එය "ඉඳුරාන රාජකරුණා අනුස්මරණ ජාත්‍යන්තර කුඩා පරිමාණ ජල විදුලිබල පුහුණු මධ්‍යස්ථානය " ඉදි කිරීමට අවශ්‍ය මූලික කටයුතු සඳහා වියදම් කර ඇත. පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය රු. මි. 15 ක් අනුමත කළ බැවින් එය 2019 ඉදිකිරීම් පියවර 02 | අදාල ව්‍යාපෘතියට කාලීනව උපයෝජනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය සඳහා වැය කර නොතිබූ බැවින් ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති මුදල් ඵලදායිව භාවිතා වී නොමැති බවට නිරීක්ෂණය විය. | ක් යටතේ නිම කිරීමට තීරණය විය . පළමු පියවර 2019 දී නිම කිරීමට සැලසුම් කරන ලදී. | |

**3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය අතර ඇතිකර ගත් 2015 ජුනි 22 දිනැති අංක 631 දරන බදු ගිවිසුම අනුව වසර 30 ක කාලයක බදු පදනම යටතේ අධිකාරිය සඳහා 2015 වර්ෂයේ දී බත්තරමුල්ල ප්‍රදේශයෙන් පර්චස් 75 ක ඉඩමක් ලබා ගෙන තිබුණි. 2019 දෙසැම්බර් වන විට එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී රු. 5,984,915 ක වියදමක් දරා සැලසුම් සකස් කිරීම පමණක් සිදුකර තිබුණ නමුත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | සැලසුම් සකස් කළද ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂාවෙන් ඉල්ලීම් කළද රජය විසින් ගන්නා ලද තීන්දු තීරණ අනුව කටයුතු කිරීමට සිදු වේ. ඒ අනුව මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීමට මූලික අනුමැතිය ලැබුණත් ඉදිකිරීම් සඳහා අනුමැතිය ජාතික සැලසුම් අංශය (National Planning Division) ලබාදිය යුතුය. 2019 දී පැවැති රජය ගත් ප්‍රතිපත්තිමය තීරණ අනුව ඉදිකිරීම් තාවකාලිකව නවතා දැමූ බැවින් අපගේ ඉල්ලීමද ලබාදීමෙන් බැහැරවිය. | වර්ෂ 05ට ආසන්න කාලයක් පසු වී ඇති බැවින් විකල්ප අරමුදල් සපයා ගැනීමේ මාර්ග සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත අනුමත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ මාස 08 ක පමණ ප්‍රමාදයකින් පසුව 2019 නොවැම්බර් 04 දිනය. | 2018 වර්ෂයේ දී අධිකාරිය තුල මූල්‍ය අංශයේ ප්‍රධානියකු නොමැති වීම නිසා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා විගණන වාර්තාව නිකුත් වූයේ 2019 ජූලි මස 05 දිනය. එබැවින් 2017 විගණන වාර්තාවේ නිර්දේශ ද ඇතුලත් කොට 2018 මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන නිසි කලට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |

## 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12/දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව ආයතනයේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගෙන නොතිබුණි. | බලශක්ති ප්‍රතිපත්ති සකස් කිරීමෙන් පසු ඊට අනුරූප වන පරිදි ආයතන්ක සංයුක්ත සැලැස්ම සම්පාදනය කිරීම අරමුණ විය. මේ වන විට බලශක්ති ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඇති අතර ඒ අනුසාරයෙන් සංයුක්ත සැලැස්ම සම්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කල යුතුය. |

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරිය විසින් ක්‍රියාකාරි සැලැස්මක් වාර්ෂිකව පිළියෙල කරන නමුත් එහි ප්‍රගතිය සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තාවක් සකස් කර නොතිබුණි. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අදාල ප්‍රගති සමාලෝචන කර වර්ෂය අවසානයට වාර්තාවක් සකස් කර ඇති අතර එය විගණනයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය සමාලෝචන වාර්තාවක් සකස් කළ යුතුය. |